සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පොෂ (උසස් පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2026

භූගෝල විද්‍යාව I	22	S	I	13 ශ්‍රේණිය

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය: .....

උපදෙස්:

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත වේ.
- I කොටස බහුවරණ ප්‍රශ්න 40 කින් සමන්විත වන අතර, ඒවාට පිළිතුරු **මෙම පත්‍රයේ** ම සැපයිය යුතු ය.
- I කොටසේ නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමි වේ.
- II කොටසෙහි ප්‍රශ්න දෙකටම පිළිතුරු සැපයිය යුතු ය.
- III කොටස ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- I, II සහ III කොටස්වල පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දිය යුතු ය.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

	ප්‍රශ්න අංකය	ලකුණු
I කොටස	1 - 40	
II කොටස	1	
	2	
III කොටස	3	
	4	
	5	
	6	
එකතුව		

	අත්සන	සංකේත අංකය
1 වන පරීක්ෂක		
2 වන පරීක්ෂක		
අතිරේක ප්‍රධාන පරීක්ෂක		
ගණිත පරීක්ෂක		
ප්‍රධාන පරීක්ෂක		

I කොටස

- ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර අඩංගු වරණය තෝරා, එහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ ඇති **කිත්** ඉර මත ලියන්න.

1. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියට අදාළව පැසිපික් සාගරයේ පිහිටුවා ඇති මෙහෙයුම් මධ්‍යස්ථාන දෙක වන්නේ,

(1) දියාගෝගාෂියා හා ක්වජලෙන් ය.
(2) දියාගෝගාෂියා හා ඇසෙන්ෂන් ය.
(3) ක්වජලෙන් හා හවායි ය.
(4) ක්වජලෙන් හා ඇසෙන්ෂන් ය.
(5) ඇසෙන්ෂන් හා හවායි ය.

(.....)

2. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියට අනුව කිසියම් ස්ථානයක නිවැරදි පිහිටීම ත්‍රිමාණව (3D) තීරණය කිරීම සඳහා අවම වශයෙන් සම්බන්ධ කරගත යුතු චන්ද්‍රිකා සංඛ්‍යාව වන්නේ,

(1) දෙකකි.
(2) තුනකි.
(3) හතරකි.
(4) පහකි.
(5) හයකි.

(.....)

දෙවැනි පිටුව බලන්න


Past Papers Wiki

3. ශ්‍රී ලංකා 1:50,000 භූ ලක්ෂණ සිතියමක දැක්වෙන සංස්කෘතික ලක්ෂණයක් එයට අදාළ සම්මත වර්ණය සමඟ සඳහන් වන වරණය තෝරන්න.

(1) ඉදිකළ ප්‍රදේශය - දම් වර්ණය
(2) වනාන්තරය - කොළ වර්ණය
(3) ගංගාව - නිල් වර්ණය
(4) වැව් බැම්ම - කළු වර්ණය
(5) ගෙවතු වගාව - කහ වර්ණය

(.....)

4. 1:50,000 භූ ලක්ෂණ සිතියමක දැක්වෙන චතුරස්‍රාකාර කුඹුරුයාය පහක දිග හා පළල පහත දළ රූප සටහන්වල ලකුණු කර තිබේ.



ඉහත දැක්වෙන කුඹුරු යායන් අතුරින් $2km^2$ ක් විශාල කුඹුරු යාය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(1) A
(2) B
(3) C
(4) D
(5) E

(.....)

5. තේමා සිතියම් වලට අදාළ ප්‍රධාන ලක්ෂණයක් දැක්වෙන වරණය කුමක් ද?

(1) එක් තේමාවක අවකාශීය ව්‍යාප්තිය දැක්විය හැකි වීම.
(2) එකම සිතියම තුළ තේමා කීපයක් දැක්විය හැකි වීම.
(3) සිතියම් පත්‍ර ශ්‍රේණියක් ලෙස සකසා තිබීම.
(4) විවිධ සංකේත හා වර්ණ භාවිතා කර තිබීම.
(5) සෑම විටම විශාල පරිමාණයෙන් නිර්මාණය කිරීම.

(.....)

6. පහත දැක්වෙන දත්ත අතුරින් අවකාශීය නොවන දත්තය කුමක් ද?

(1) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වගා ළිං ව්‍යාප්තිය.
(2) ශ්‍රී ලංකාවේ කාලගුණ මධ්‍යස්ථානවල ව්‍යාප්තිය.
(3) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ව්‍යාප්ත වැව්වල ජල ධාරිතාව.
(4) මහවැලි ගංගාවට සම්බන්ධ අතු ගංගා ව්‍යාප්තිය.
(5) ශ්‍රී ලංකාවට අයත් ජාතික වනෝද්‍යානවල පිහිටීම.

(.....)

7. සන්තතික දත්තයක ප්‍රධාන ගුණාංගය වන්නේ,

(1) සංඛ්‍යාත්මකව ප්‍රකාශ කළ නොහැකි වීම ය.
(2) අවකාශීය දත්ත ලෙස පමණක් පැවතීම ය.
(3) අඛණ්ඩ විභිදීමක් පෙන්වීම ය.
(4) දශම සංඛ්‍යා ලෙස ලිවිය නොහැකි වීම ය.
(5) සමූහිත දත්ත ලෙස පමණක් පැවතීම ය.

(.....)

8. බහු තීරු ප්‍රස්තාරයක් මඟින් ඉදිරිපත් කළ හැකි විචල්‍යයක් දැක්වෙන වරණය තෝරන්න.

(1) යම් වර්ෂයක මහනුවර දිස්ත්‍රික්කයේ ආගමික සංයුතිය.
(2) වර්ෂ කීපයක අනුරාධපුර දිස්ත්‍රික්කයේ යල හා මහ කන්නවල වී අස්වැන්න.
(3) වර්ෂ කීපයක ශ්‍රී ලංකාවේ අපනයන සංයුතිය.
(4) යම් වර්ෂයක දිස්ත්‍රික්ක අනුව වාර්තා වූ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව.
(5) යම් කාලගුණ මධ්‍යස්ථානයක මාසික උෂ්ණත්වය හා වර්ෂාපතනය.

(.....)

9. ජාල රේඛය සම්බන්ධයෙන් පහත දී ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ජාල රේඛය යනු රේඛා ප්‍රස්තාර විශේෂයකි.

(2) සමුඛිත දත්ත ව්‍යාප්තියක සංඛ්‍යාතය ජාල රේඛයක් මඟින් දැක්වේ.

(3) අසමුඛිත දත්ත ව්‍යාප්තියක චාතුර්ථික ඉදිරිපත් කිරීමට ජාල රේඛය භාවිතා කරයි.

(4) සමුඛිත දත්ත ව්‍යාප්තියක සමුච්චිත සංඛ්‍යාතය ජාල රේඛයක් මඟින් දැක්වේ.

(5) ජාල රේඛය නිර්මාණය කරනු ලබන්නේ සංඛ්‍යාත බහු අස්‍රය ඇසුරිනි. (.....)

10. සම සංඛ්‍යා සිතියම් මඟින් ඉදිරිපත් කළ හැකි විචල්‍යය පමණක් දැක්වෙන වරණය කුමක් ද?

(1) වර්ෂාපතනය, ජන ඝනත්වය, පීඩනය, ගැඹුර

(2) ජන ඝනත්වය, කෘෂි අස්වැන්න, වර්ෂාපතනය, පීඩනය

(3) උෂ්ණත්වය, වර්ෂාපතනය, භූමි පරිභෝගය, ජන ඝනත්වය

(4) උන්නතාංශය, උෂ්ණත්වය, පීඩනය, වර්ෂාපතනය

(5) වර්ෂාපතනය, උෂ්ණත්වය, භූමි පරිභෝගය, පීඩනය (.....)

11. ජෛව ගෝලයට අයත් සංවිධාන මට්ටම් ආරෝහණ පිළිවෙලට දැක්වෙන වරණය කුමක් ද?

(1) ජීවියා, ගහනය, ප්‍රජාව, පරිසර පද්ධතිය, ජෛව ගෝලය

(2) ජීවියා, ගහනය, පරිසර පද්ධතිය, ප්‍රජාව, ජෛව ගෝලය

(3) ජීවියා, ප්‍රජාව, ගහනය, පරිසර පද්ධතිය, ජෛව ගෝලය

(4) ජීවියා, ප්‍රජාව, පරිසර පද්ධතිය, ගහනය, ජෛව ගෝලය

(5) ජීවියා, පරිසර පද්ධතිය, ගහනය, ප්‍රජාව, ජෛව ගෝලය (.....)

12. කිරිගරුඬ නිර්මාණය වන්නේ,

(1) ග්‍රැනයිට් විපරිත වීමෙනි.

(2) වැලිගල් විපරිත වීමෙනි.

(3) හුණුගල් විපරිත වීමෙනි.

(4) සිස්ට් විපරිත වීමෙනි.

(5) බැසෝල්ට් විපරිත වීමෙනි. (.....)

13. කතරගම කඳු අයත් වන පාෂාණ කලාපය කුමක් ද?

(1) උස්බිම් සංකීර්ණය

(2) වන්නි සංකීර්ණය

(3) විජයාතු සංකීර්ණය

(4) කඩුගන්නාව සංකීර්ණය

(5) මයෝසීන හුණුගල් තීරය (.....)

14. ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත ප්‍රධාන පාංශු ගණයක ලක්ෂණ කිපයක් පහත දැක්වේ.

- මනා ජල වහනයකින් යුක්තය.
- සියුම් වයනයක් දක්නට ලැබේ.
- කොකෝවා හා කෙසෙල් වගාව සඳහා ඉතා යෝග්‍ය වේ.

ඉහත ලක්ෂණවලට අදාළ පාංශු ගණය වන්නේ,

(1) රතු දුඹුරු පස ය.

(2) රතු කහ පොඩ්සොලික් පස ය.

(3) රතු කහ ලැටසොල්ස් පස ය.

(4) ක්ෂාරීය නොවන දුඹුරු පස ය.

(5) රතු දුඹුරු ලැටසොල්ස් පස ය. (.....)

15. ආතනීය චලන හේතුවෙන් නිර්මාණය වන යාබද රූප සටහනේ දැක්වෙන භූ රූපය කුමක් ද?


(1) උඩුකුරු විභේදය

(2) සුවිභේද නිමිනය

(3) හෝස්ට් විභේදය

(4) සෝපාන විභේදය

(5) උලැඟි විභේදය




(.....)

16. පැසිපික් ගිණි වළල්ල හෙවත් පරිපැසිපික් කලාපයට අයත් වන ගිණි කඳු පමණක් දැක්වෙන වරණය තෝරන්න.

(1) හෙක්ලා, එට්නා, ශාන්ත හෙලේනා, ෆුජියාමා
(2) ක්‍රැකටෝවා, විසුවියස්, මවුනා ලෝආ, හෙක්ලා
(3) එට්නා, ස්ට්‍රම්බොලි, විසුවියස්, පිනාටුබෝ
(4) පිනාටුබෝ, මවුනා ලෝආ, ෆුජියාමා, ක්‍රැකටෝවා
(5) ශාන්ත හෙලේනා, හෙක්ලා, ක්‍රැකටෝවා, පිනාටුබෝ (.....)

17. පහත රූප සටහනේ දැක්වෙන භූ රූපය නිර්මාණය වන්නේ,



(1) තරංග නිධි සාධනය මඟිනි.
(2) තරංග ඛාදනය මඟිනි.
(3) සුළං ඛාදනය මඟිනි.
(4) සුළං නිධි සාධනය මඟිනි.
(5) ගංගා නිධි සාධනය මඟිනි. (.....)

18. භූණුගල් ගුහාවක් අභ්‍යන්තරයේ නිර්මාණය වන භූ රූපයක් වන්නේ,

(1) කුමුටුවල ය.
(2) දෝලිනා ය.
(3) ලැපීස් ය.
(4) පොල්ජේ ය.
(5) හිරිටැඹ ය. (.....)

19. ශ්‍රී ලංකාවේ ඊසාන දිග මෝසම් වර්ෂාපතනයේ කැපී පෙනෙන ලක්ෂණය මේ අතුරින් කවරක් ද?

(1) සවස් කාලයේදී අකුණු සහිත ධාරානිපාත වර්ෂාවක් ලැබීම.
(2) විශාල ගොඩබිම් ප්‍රදේශයක් හරහා සුළං හමා ඒම නිසා ජල වාෂ්ප අඩු වීම.
(3) මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුමට අධික වර්ෂාපතනයක් ලැබීම.
(4) අන්තර් නිවර්තන අභිසරණ කලාපය දිවයිනට උතුරින් පිහිටා තිබීම.
(5) රාත්‍රී කාලයේදී වැසි රහිත පැහැදිලි අහසක් දක්නට ලැබීම. (.....)

20. පහත සඳහන් වායු වර්ග අතුරින් හරිතාගාර වායුවක් **නොවන්නේ** කුමක් ද?

(1) මීතේන්
(2) සල්ෆර් ඩයොක්සයිඩ්
(3) නයිට්‍රස් ඔක්සයිඩ්
(4) කාබන්ඩයොක්සයිඩ්
(5) ක්ලෝරෝ ෆ්ලොරෝ කාබන් (.....)

21. එල්නිනෝ සංසිද්ධිය ආරම්භ වන්නේ,

(1) උරුගුවේ හා ආජන්ටිනාව අවට අත්ලන්තික් සාගරයේ ය.
(2) වෙනිසියුලාව හා බ්‍රසීලය අවට අත්ලන්තික් සාගරයේ ය.
(3) පේරු හා ඉක්වදෝරය අවට පැසිපික් සාගරයේ ය.
(4) පැපුවා නිව්ගිනියාව හා ඕස්ට්‍රේලියාව අවට පැසිපික් සාගරයේ ය.
(5) ජාවා හා සුමාත්‍රා දූපත් අවට ඉන්දියන් සාගරයේ ය. (.....)

22. සහජාත ජලය ලෙස හඳුන්වනු ලබන්නේ,

(1) පොළොවට කිඳා බැස ඇති ජලය යි.
(2) උණු දිය උල්පත් ආදියේ තැන්පත් ජලය යි.
(3) ශාක මූලකේශ මඟින් උරාගන්නා ජලය යි.
(4) අවසාදිත තට්ටු අතර තැන්පත් ජලය යි.
(5) ශාක පත්‍ර මඟින් උත්ස්වේදනය වන ජලය යි. (.....)

23. පහත දැක්වෙන ගංගා අතුරින් සෘතුමය ගංගාවක් ලෙස සැලකිය හැක්කේ කුමන ගංගාව ද?

(1) වලවේ ගඟ
(2) මහවැලි ගඟ
(3) නිල්වලා ගඟ
(4) දැදුරු ඔය
(5) යාන් ඔය (.....)

24. මධ්‍යධරණී බියෝමයට ආවේණික ලක්ෂණයක් වන්නේ,
(1) බොහෝ ශාක පත්‍රනාශීලි වීම ය.
(2) ශාක ස්තරායනයක් දක්නට ලැබීම ය.
(3) නියඟයට ඔරොත්තු දෙන ශුෂ්ක රූපී ශාක තිබීම ය,
(4) බහුල වශයෙන් තෘණ වර්ග දක්නට ලැබීම ය.
(5) වනාන්තරවල පෙළ විවිධත්වය ඉතා ඉහළ වීම ය. (.....)

25. දේශගුණ විද්‍යාත්මක උපද්‍රව පමණක් දැක්වෙන වරණය තෝරන්න.
(1) ජල ගැලීම්, අකුණු සැර, නියඟ
(2) අකුණු සැර, සුළි සුළං, සුනාමි
(3) සුනාමි, නාය යෑම්, ළැව් ගිනි
(4) ළැව් ගිනි, ජල ගැලීම්, භූමිකම්පා
(5) භූමිකම්පා, සුළි සුළං, නියඟ
(.....)

26. ලෝකයේ ජන ඝන ප්‍රදේශයකට නිදසුනකි,
(1) ඩෙකැන් සානු ප්‍රදේශය.
(2) ඇමසන් ගංගා ද්‍රෝණිය.
(3) මිසිසිපි ගංගා ද්‍රෝණිය.
(4) උතුරු යුරෝපා තැනිතලාව.
(5) සිලිකන් නිම්නය.
(.....)

27. 2050 වන විට ලෝකයේ ජනාධිකම රටවල් දහය අතරට අයත්වන අප්‍රිකානු රටවල් තුන වන්නේ,
(1) නයිජීරියාව, කොංගෝව හා ඉතියෝපියාව
(2) නයිජීරියාව, කෙන්යාව හා දකුණු සුඩානය
(3) නයිජීරියාව, කොංගෝව හා සෝමාලියාව
(4) ඉතියෝපියාව, කොංගෝව හා සෝමාලියාව
(5) ඉතියෝපියාව, දකුණු අප්‍රිකාව හා ටැන්සානියාව
(.....)

28. ශ්‍රී ලංකාවේ නුවරඑළිය හා හික්කඩුව වැනි නගර අයත් වන්නේ,
(1) ප්‍රථමතා නගර ගණයට ය.
(2) ප්‍රතිමෝධක නගර ගණයට ය.
(3) සංස්කෘතික නගර ගණයට ය.
(4) වරාය නගර ගණයට ය.
(5) හරිත නගර ගණයට ය.
(.....)

29. ජනාවාස වර්ධන ධූරාවලියේ පුරවරයට ඉහළින් පවතින ජනාවාස වර්ගය හඳුන්වන නම කුමක් ද?
(1) නගරය
(2) මහ නගරය
(3) නාගරික සමූහිතය
(4) නගර යාය
(5) නාගරික වෙදිකාව
(.....)

30. ඓන්ද්‍රීය කෘෂිකර්මයේ පාරිසරික ප්‍රතිලාභයක් වන්නේ,
(1) දේශගුණික වෙනස්කම්වලට හේතු නොවීම ය.
(2) නව රැකියා අවස්ථා නිර්මාණය වීම ය.
(3) කාන්තාව සවිබල ගැන්වීමට හේතු වීම ය.
(4) සාම්ප්‍රදායික කෘෂි දැනුම වර්ධනය වීම ය.
(5) නිෂ්පාදනවල පෝෂණ මට්ටම ඉහළ යාම ය.
(.....)

31. ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනය පිහිටා ඇති රට හා නගරය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
(1) ඉන්දියාව - අහමදාබාද්
(2) පිලිපිනය - මැනිලා
(3) ජපානය - ටෝකියෝ
(4) ඉන්දුනීසියාව - ජකර්තා
(5) තායිලන්තය - බැංකොක්
(.....)

32. ශ්‍රී ලංකාවේ වාණිජ කෘෂිකර්මය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ගම්වැසියන්ගේ දෛනික ආහාර අවශ්‍යතාව මෙමඟින් සපුරා ගනී.
(2) යැපුම් කෘෂිකර්මාන්තය ලෙසද මෙය හඳුන්වයි.
(3) මහා පරිමාණයෙන් විශාල භූමි ප්‍රමාණයක වගා කරයි.
(4) මිනිස් හා සත්ත්ව ශ්‍රමය බහුල වශයෙන් යොදා ගනී.
(5) කුඩා හා මධ්‍යම පරිමාණ ඉඩම්වල වගාකරයි. (.....)

33. ජන භායනය පිළිබිඹු කරන පිරමීඩයක් පවතින රටක,
(1) උපත් අනුපාතිකය ඉහළ අගයක් ගනියි.
(2) ළමා ජන සංඛ්‍යාව සාපේක්ෂව අඩු ය.
(3) වයස්ගත ජන සංඛ්‍යාව සාපේක්ෂව අඩු ය.
(4) දළ මරණ අනුපාතිකය ඉහළ අගයක් ගනියි.
(5) ජනගහන වර්ධන වේගය ඉහළ අගයක් ගනියි. (.....)

34. මහවැලි ජනාවාස ධූරාවලිය තුළ ගිරාදුරුකෝට්ටේ හා දෙඹිඅත්තකණ්ඩිය අයත් වන්නේ,
(1) කුඩා ගම්මාන වලට ය.
(2) ග්‍රාමීය මධ්‍යස්ථාන වලට ය.
(3) ප්‍රාදේශීය මධ්‍යස්ථාන වලට ය.
(4) නගර මධ්‍යස්ථාන වලට ය.
(5) නව නගර මධ්‍යස්ථාන වලට ය. (.....)

35. සාර්ක් සංවිධානයේ මූලස්ථානය පිහිටා ඇත්තේ කොහේ ද?
(1) තිම්පු
(2) නවදිල්ලිය
(3) කත්මන්ඩු
(4) ඩැකා
(5) ලාහෝර් (.....)

36. වර්තමානයේදී යුරෝපා සංගමයෙන් ඉවත් වී ඇති රට මේ අතුරින් කුමක් ද?
(1) බෙල්ජියම
(2) එක්සත් රාජධානිය
(3) නෙදර්ලන්තය
(4) ඉතාලිය
(5) ඩෙන්මාර්කය (.....)

37. ගල් අඟුරු නිෂ්පාදනයේ ප්‍රමුඛත්වය හිමිකර ගන්නා රට කුමක් ද?
(1) චීනය
(2) ඉන්දියාව
(3) ඕස්ට්‍රේලියාව
(4) රුසියාව
(5) ඉන්දුනීසියාව (.....)

38. ශ්‍රී ලංකාවේ මිනිරන් කර්මාන්තය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ශ්‍රී ලංකාවේ බහුල වශයෙන් ප්‍රයෝජනයට ගන්නේ තලාතු මිනිරන් ය.
(2) වර්තමානයේ මිනිරන් කැණීම මුළුමනින්ම සිදුවන්නේ මිනිස් ශ්‍රමයෙනි.
(3) ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත මිනිරන් වලින් බහුතරය අපනයනය කරනු ලැබේ.
(4) මිනිරන් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත රැසක් ශ්‍රී ලංකාව තුළ ස්ථානගතව ඇත.
(5) ශ්‍රී ලංකාවේ මිනිරන් කර්මාන්තයට ඇත්තේ මෑත කාලීන ඉතිහාසයකි. (.....)

39. ආනයනික ක්ලින්කර් හා ජිප්සම් භාවිතා කොට සිමෙන්ති කර්මාන්තය ස්ථානගත වී ඇති ප්‍රදේශයක් වන්නේ,
(1) කන්කසන්තුරය ය.
(2) පුත්තලම ය.
(3) කළුතර ය.
(4) ගාල්ල ය.
(5) මාතර ය. (.....)

40. ගෝලීයකරණයේ අවාසියක් දැක්වෙන වරණය තෝරන්න.
(1) අධ්‍යාපන අවස්ථා හා තාක්ෂණික දැනුම් හුවමාරු කර ගත හැකි වීම.
(2) බටහිරකරණය පදනම් කරගත් විශ්ව සංස්කෘතියක් පැතිර යාම.
(3) අපනයන වෙළඳපළ ප්‍රසාරණය කර ගත හැකි වීම.
(4) අඩු දියුණු රටවලට ව්‍යවසායකත්වය ලබා ගැනීමට හැකි වීම.
(5) අඩු දියුණු රටවලට මානව ප්‍රාග්ධනය ලබාගත හැකි වීම. (.....)

**

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පො.ස (උසස් පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2026

භූගෝල විද්‍යාව I	22	S	I	13 ශ්‍රේණිය

උපදෙස්:

- **II** කොටසෙහි ප්‍රශ්න දෙකට ම පිළිතුරු සැපයිය යුතු ය.
- **III** කොටස ප්‍රශ්න හතරකින් සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා 1:50,000 රත්නපුරය භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ද ලෝක ආකෘති සිතියමක් ද ප්‍රස්තාර කඩදාසි දෙකක් ද සපයනු ලැබේ.

II කොටස

1. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50,000 පරිමාණයේ රත්නපුරය භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ච රේඛා අන්තරය මීටර් 20 කි. එම සිතියම පදනම් කර ගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සැලකිය යුතුයි:

- **පිළිතුරු සිතියමෙහි ලිවිය යුතු නොවේ.**
- **ප්‍රශ්න අංකය සහ අදාළ උප කොටස්වල අංක පිළිතුරු පත්‍රයේ පැහැදිලි ව සඳහන් කළ යුතු ය.**
- **සිතියම ඔබේ පිළිතුරු පත්‍රයට ඇමිණිය යුතු නොවේ.**

(i) AB සහ CD රේඛාවන් ඔස්සේ හඳුනාගත හැකි නිම්න වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) E සහ F චතුරස්‍ර තුළ හඳුනාගත හැකි ජලවහන ලක්ෂණ දෙක නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) GH රේඛාව ඔස්සේ දැක්වෙන බෑවුම කුමක් ද? (ලකුණු 01 යි)

(iv) I චතුරස්‍රය තුළ දක්නට ලැබෙන මාර්ග කොටස ඉදිකිරීමේදී ප්‍රයෝජනයට ගෙන තිබෙන භූ විෂමතා ලක්ෂණය කුමක් ද? (ලකුණු 01 යි)

(v) සමස්ත සිතියම් ප්‍රදේශය තුළ හඳුනාගත හැකි ප්‍රධාන ජලවහන රටාව නම් කරන්න. (ලකුණු 01 යි)

(vi) J හා K චතුරස්‍ර තුළ දක්නට ලැබෙන පරිපාලන මායිම් දෙක නම් කරන්න. (ලකුණු 02 යි)

(vii) X ස්ථානයට අදාළ නිරපේක්ෂ පිහිටීම නිවැරදිව ලියා දක්වන්න. (ලකුණු 01 යි)

(viii) Z චතුරස්‍රය ඒ තුළ දැක්වෙන මාර්ග ජාලය සමඟ 1:20,000 පරිමාණයට ඇඳ දක්වන්න. (ලකුණු 04 යි)

(ix) සිතියම් ප්‍රදේශයේ කෘෂිකාර්මික භූමි පරිභෝගය හා භූ විෂමතාව අතර දක්නට ලැබෙන සම්බන්ධය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

2. ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි සම්මත සංකේත හා වර්ණ යොදාගනිමින් පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.

- කොරල් මුහුදු
- හෝන් තුඩුව
- ප්‍රෙයරිස් කෘෂණ භූමිය
- ඇනටෝලියා සානුව
- මොසැම්බික් ඕඩය
- ගෝබී කාන්තාරය
- යුකටාන් අර්ධද්වීපය
- බලූ බනානා
- ලෝකයේ ගැඹුරුම සාගරික අගාධය
- ලෝක සංචාරක සංවිධානයේ මූලස්ථානය පිහිටි නගරය (ලකුණු 10 යි)

III කොටස

3. (i) දුරස්ථ සංවේද වේදිකාවක් යනු කුමක් ද? (ලකුණු 01 යි)

(ii) පහත සඳහන් දුරස්ථ සංවේද වේදිකාවල ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(a) වාසර වේදිකා

(b) අභ්‍යවකාශ වේදිකා

(iii) භූවන් ඡායාරූප හා චන්ද්‍රිකා ප්‍රතිබිම්බ අතර දක්නට ලැබෙන වෙනස්කම් දෙකක් සංසන්දනාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) දුරස්ථ සංවේදය ප්‍රායෝගිකව භාවිතා කරන ක්ෂේත්‍ර තුනක් නිදසුන් සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

4. 2014 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කටුගස්තොට කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයෙන් ජනවාරි මාසයේදී වාර්තා වූ මුළු වර්ෂාපතනය වගුව 01 හි දක්වා ඇත. එම දත්ත භාවිතා කරමින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වගුව 01 : 2014 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කටුගස්තොට කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයෙන් ජනවාරි මාසයේදී වාර්තා වූ මුළු වර්ෂාපතනය

වර්ෂය	වර්ෂාපතනය (mm)	වර්ෂය	වර්ෂාපතනය (mm)
2014	73	2019	4
2015	6	2020	23
2016	4	2021	143
2017	106	2022	14
2018	21	2023	46

මූලාශ්‍රය : ශ්‍රී ලංකා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

(i) මධ්‍යන්‍යය වර්ෂාපතනය ගණනය කරන්න. (ලකුණු 01 යි)

(ii) පහත සඳහන් වගුව 02 ඔබගේ පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන එහි හිස්තැන් සම්පූර්ණ කරන්න.

වගුව 02 :

වර්ෂය	x	$\bar{x}$	$(x-\bar{x})$	$(x-\bar{x})^2$
2014	73			
2015	6			
2016	4			
2017	106			
2018	21			
2019	4			
2020	23			
2021	143			
2022	14			
2023	46			
			$\sum(x-\bar{x}) =$	$\sum(x-\bar{x})^2 =$

(ලකුණු 03 යි)

(iii) ඔබ විසින් සම්පූර්ණ කරන ලද වගුව 02 හි දත්ත පදනම් කර ගනිමින් පහත දැක්වෙන අපකිරණ මිනුම් ගණනය කරන්න. (ලකුණු 03 යි)

(a) මධ්‍යන්‍යය අපගමනය

(b) සම්මත අපගමනය

(iv) වගුව 02 හි ගණනය කරන ලද අපගමන අගයන් ඇසුරින් අපගමන ප්‍රස්තාරයක් නිර්මාණය කරන්න. (මේ සඳහා සපයා ඇති ප්‍රස්තාර කඩදාසියක් භාවිත කරන්න) (ලකුණු 05 යි)

(v) ඔබ විසින් නිර්මාණය කරන ලද අපගමන ප්‍රස්තාරය ඇසුරින් ජනවාරි මාසයේ කටුගස්තොට වර්ෂාපතනයෙහි කැපී පෙනෙන ලක්ෂණ තුනක් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03 යි)

PAST PAPERS WIKI

5. (i) සමීක්ෂණයකදී සංගහනය හා නියැදිය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) පහත දැක්වෙන දත්ත යුගල් අතර වෙනස පහදන්න. (ලකුණු 03 යි)

(a) ප්‍රාථමික දත්ත හා ද්විතියික දත්ත

(b) ප්‍රමාණාත්මක දත්ත හා ගුණාත්මක දත්ත

(c) සන්තතික දත්ත හා විච්ඡින්න දත්ත

(iii) නිරීක්ෂණය මඟින් ප්‍රාථමික දත්ත රැස් කළ හැකි ප්‍රධාන ආකාර **දෙක** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) (a) ද්විතියික දත්ත මූලාශ්‍ර **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(b) පර්යේෂණයක් සඳහා ද්විතියික දත්ත භාවිතයේදී මුහුණ පෑමට සිදුවන ගැටලු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

6. වගුව 03 හි දක්වා ඇති දත්ත භාවිත කරමින් මතු සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වගුව 03 : ශ්‍රී ලංකාවේ වයස් කාණ්ඩ හා ලිංගිකභාවය අනුව ඇස්තමේන්තු කරන ලද මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාව - 2024 (දහස් ගණනින්)

වයස් කාණ්ඩය	පුරුෂ ජන සංඛ්‍යාව	ස්ත්‍රී ජන සංඛ්‍යාව
0-9	1901	1868
10-19	1778	1764
20-29	1600	1724
30-39	1596	1685
40-49	1376	1468
50-59	1163	1291
60-69	761	908
>70	436	602

මූලාශ්‍රය : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව, 2025

(i) වගුව 03 හි දැක්වෙන දත්ත භාවිත කරමින් 2024 වර්ෂයේ ශ්‍රී ලංකාවේ වයස් සහ ලිංගිකභාව ව්‍යුහය දැක්වීම සඳහා පිරමීඩ ප්‍රස්තාරයක් නිර්මාණය කරන්න.
(මේ සඳහා සපයා ඇති ප්‍රස්තාර කඩදාසියක් භාවිත කරන්න) (ලකුණු 08 යි)

(ii) ජන සංඛ්‍යාවක වයස් සහ ලිංගිකභාව ව්‍යුහය දැක්වෙන පිරමීඩ ප්‍රස්තාරයකින් ලබාගත හැකි ප්‍රයෝජන **දෙකක්** කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 04 යි)

(iii) වගුව 03 හි දත්ත නිරූපණය සඳහා පිරමීඩ ප්‍රස්තාරය හැර යොදාගත හැකි වඩාත්ම සුදුසු විෂය නිර්දේශිත ප්‍රස්තාර වර්ගය නම් කර, එහි යෝග්‍යතාව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

***

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පොස (උසස් පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2026

භූගෝල විද්‍යාව II	22	S	II	13 ශ්‍රේණිය

පැය තුනයි	අමතර කියවීම් කාලය - මිනිත්තු 10


අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස්:
- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

I කොටස - භෞතික භූගෝල විද්‍යාව

1. (i) ප්‍රධාන ග්ලැසියර් වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත රූප සටහනෙහි A, B, C, D, E සහ F ලෙස සලකුණු කර ඇති ග්ලැසියර් බාදිත භූ රූප හය නම් කරන්න. (ලකුණු 06 යි)



(iii) ග්ලැසියර් නිධි සාධනය හරහා නිර්මාණය වන භූ රූප තුනක නිර්මාණ ක්‍රියාවලිය රූප සටහන් ආධාරයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) ග්ලැසියර් භූ දර්ශනය මානුෂ ක්‍රියාකාරකම්වලදී උපයෝජනයට ගන්නා අවස්ථා **තුනක්** නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 06 යි)

2. (i) කාලගුණ මූලිකාංග **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පෘථිවි වායුගෝලයේ පරිවර්තීගෝලය තුළ ක්‍රියාත්මක වන පහත සඳහන් සංසිද්ධීන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(a) පරිසර පතන ශීඝ්‍රතාව

(b) වියළි පතන ශීඝ්‍රතාව

(c) තෙත් පතන ශීඝ්‍රතාව

(iii) දේශගුණ පාලන සාධක තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) කෙපන්ගේ දේශගුණ වර්ගීකරණයේ නිවර්තන දේශගුණ වර්ගයට අයත් උප ප්‍රභේද තුනෙහි කැපී පෙනෙන දේශගුණ ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

3. (i) බියෝමයක් යන්න අර්ථ දක්වන්න. (ලකුණු 02 යි)

(ii) පහත දැක්වෙන බියෝමයන්ගේ වෘක්ෂලතාවල ස්වභාවය විස්තර කරන්න. (ලකුණු 06 යි)

(a) ටයිගා බියෝමය

(b) කාන්තාර බියෝමය

(c) තුන්ද්‍රා බියෝමය

(iii) ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය සඳහා දායක වන පාරිසරික සංවිධාන / ආයතන තුනක කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ පාරිසරික සංවිධාන / ආයතන මුහුණ දෙන අභියෝග තුනක් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

4. (i) ආපදා කළමනාකරණ චක්‍රයේ ප්‍රධාන අවස්ථා භතර නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඔබ විසින් ඉහත නම් කළ ඕනෑම අවස්ථා තුනකට අදාළ කාර්යයන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iii) ස්වාභාවික උපද්‍රව ආපදාවක් බවට පත්වීමේ අවකාශය තීව්‍ර කරන මානුෂ ක්‍රියාකාරකම් තුනක් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග තුනක් පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

5. ශ්‍රී ලංකාවේ වයස් කාණ්ඩ අනුව 2012 හා 2024 වර්ෂවල පුම්භිරි අනුපාතය වගුව 01 හි දැක්වේ.

වගුව 01 : ශ්‍රී ලංකාවේ වයස් කාණ්ඩ අනුව පුම්භිරි අනුපාතය (2012 සහ 2024)

වයස (අවුරුදු)	පුම්භිරි අනුපාතය	
	2012	2024
ශ්‍රී ලංකාව	**93.8**	**93.3**
0-4	101.7	101.2
5-9	101.9	102.7
10-14	102.2	103.1
15-19	99.5	102.3
20-24	93.9	96.6
25-29	91.9	93.4
30-34	94.6	93.3
35-39	94.9	94.3
40-44	94.8	96.3
45-49	92.6	96.1
50-54	91.1	94.3
55-59	88.9	89.7
60-64	86.4	86.3
65-69	81.2	82.0
70 හා ඊට වැඩි	72.2	69.8

මූලාශ්‍රය : ජන හා නිවාස සංගණන වාර්තාව - 2025

(i) පුම්භිරි අනුපාතය යනු කුමක් ද? (ලකුණු 02 යි)


(ii) ඉහත වගුව 01 ට අනුව ශ්‍රී ලංකාවේ පුම්භිරි අනුපාතය සම්බන්ධයෙන් හඳුනාගත හැකි කැපිපෙනෙන ලක්ෂණ තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) පුම්භිරි අනුපාතය පහළ බැසීම නිසා මුහුණ පෑමට සිදුවන ගැටලු තුනක් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iv) පුම්භිරි අනුපාතය පහළ බැසීම නිසා පැන නගින ගැටලු අවම කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග තුනක් විස්තර කරන්න. (ලකුණු 06 යි)

6. (i) ජනාවාසයක මූලිකාංග **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ලෝකයේ දක්නට ලැබෙන ප්‍රධාන ජනාවාස රටා දෙක පහත රූප සටහනෙහි A හා B වශයෙන් දක්වා තිබේ.



(a) A හා B රූප සටහන් මඟින් දැක්වෙන ජනාවාස රටා **දෙක** නම් කරන්න.

(b) A හා B ජනාවාස රටාවන් නිර්මාණය වීම කෙරෙහි බලපාන හේතු සාධක කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ශ්‍රී ලංකාවේ පහත දැක්වෙන ග්‍රාමීය ජනාවාස වර්ගවල කැපී පෙනෙන ලක්ෂණ පැහැදිලි කරන්න.

(a) වියළි කලාපීය වැව් ගම්මාන

(b) වතු ජනාවාස (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ ජනාවාස ආශ්‍රිත නව ප්‍රවණතා **තුනක්** පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

7. (i) ආකර කැණීමේ ප්‍රධාන ක්‍රම දෙක කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02 යි)

(ii) ලෝකයේ පෙට්‍රෝලියම් සංචිතවල භූගෝලීය ව්‍යාප්තියෙහි කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iii) ලෝක පෙට්‍රෝලියම් වෙළඳාමේ කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාව තුළ බලශක්ති ඉල්ලුම සපුරාලීම් සඳහා පෙට්‍රෝලියම් වෙනුවට භාවිතා කළ හැකි විකල්ප බලශක්ති ප්‍රභව **තුනක** විභවතාව සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

8. (i) ජාත්‍යන්තර නිර්වචන අනුව ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයෙක් ලෙස පිළිගන්නේ කවුරුන් ද? (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ ඕනෑම සංචාරක කලාප **තුනක** භූගෝලීය ව්‍යාප්තිය හා එම කලාප ප්‍රකට වී තිබෙන සංචරණ ප්‍රභේදයන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයෙහි සමාජ - සංස්කෘතික බලපෑම් **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

***


සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

13 ශ්‍රේණිය	අ.පො.ස (උසස් පෙළ) පෙරහුරු පරීක්ෂණය 2026	22	S,T,E	I

භූගෝල විද්‍යාව - புவியியல் - Geography

140



165

SCALE 1 : 50,000

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පො.ස (උසස් පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2026

භූගෝල විද්‍යාව	22	S	13 ශ්‍රේණිය

ලකුණු දීමේ පටිපාටිය

භූගෝල විද්‍යාව I

I කොටස

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
01	3	21	3
02	3	22	4
03	5	23	5
04	2	24	3
05	1	25	1
06	3	26	2
07	3	27	1
08	3	28	2
09	2	29	3
10	4	30	1
11	1	31	2
12	3	32	3
13	1	33	2
14	5	34	5
15	2	35	3
16	4	36	2
17	4	37	1
18	5	38	3
19	2	39	4
20	2	40	2

(ලකුණු 01 x 40 = 40 යි)

CamScanner

II කොටස

1. (i) AB - තීරයක් නිම්නය

CD - ආයතගාම් නිම්නය (ලකුණු 01 x 02 = 02)

(ii) E - හැඩපළු ගංගාව

F - ගං දිගර්ය (ලකුණු 01 x 02 = 02)

(iii) ඇවතල කැවුම (ලකුණු 01)

(iv) කපොල්ල (ලකුණු 01)

(v) ආලෝකාර ජලභාන රටාව (ලකුණු 01)

(vi) J - පළාත් මායිම.

K - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම (ලකුණු 01 x 02 = 02)

(vii) X = (165 000 mN, 140 000 mE) (ලකුණු 01)

(viii) 1:50 000 සිතියම් කොටසක් 1:20 000 පරිමාණයට නිර්මාණය කිරීමේදී සිතියම 2.5 (50000/20000 = 2.5) ගුණයකින් විශාලනය වේ. එබැවින් Z චතුරස්‍රයේ දිග හා පැළ 2.5 න් ගුණාකර ඇඳ තිබිය යුතුය. එසේම ප්‍රධාන මාර්ගය හා අප්‍රධාන මාර්ග චතුරස්‍රය තුළ ඇඳ තිබිය යුතුය.

- චතුරස්‍රය විශාලනය කර ඇඳීම = ලකුණු 02
- මාර්ග පද්ධතිය සම්පත චර්ණයෙන් ඇඳීම = ලකුණු 1.5
- නියෝජන පරිමාණය ලියා දැක්වීම = ලකුණු 0.5

විකල්ප = ලකුණු 04

(ix) • මෙම 1:50 000 රත්නපුර භූ ලක්ෂණ සිතියම් කොටසේ කැපී පෙනෙන භූ විෂමතා ලක්ෂණය වන්නේ වයඹ - ගිනිකොන දිශානුසාරීව විහිදෙන හෙල්වැටි සමූහය යි. එසේම ඛණ්ඩ හෙල්වැටි විහිදෙන දිශාවට සමාන්තරව විහිදුන් ආයතගාම් නිම්න සහ හෙල්වැටි විහිදෙන දිශාවට ප්‍රතිවිරුද්ධව විහිදුන් තීරයක් නිම්නයන් හඳුනා ගත හැකිය.

- වී වගාව, රබර් වගාව, තේ වගාව, ගෙවතු වගාව, පේන් වගාව, පොල් වගාව හා වෙනත් වැනිලි යන නාම්කාර්මික භූමි පරිභෝගයන් සිතියම් ප්‍රදේශය තුළ නිරීක්ෂණය කළ හැකිය.
- ආයතගාම් හා තීරයන් නිම්න ආශ්‍රිත එසාත්ත වී වගා බිම් නිපයක් හැඳින ගත හැකිය. ජල සම්පාදන පහසුවන්,

ගංගා නිම්නයේ නී ඉගාවට උසින අියල් පසක් පැවතීමත් වයට හේතු වී තිබේ. වර්ෂේම සිතියමේ ගිනිකොනදිග කාර්තුව තුළ වසාප්ත වෙල්ලල නී ඉගා තිම් කීපයක් ද නිරීක්ෂණය කළ හැකිය.


- කඳු මැටි වලු උසින් යුඩ් ප්‍රදේශයේ රතර් හා තේ වගාවන් වසාප්ත වී තිබේ.
- මඩ තෘතුම් හා නිම්න පාශ්‍රිත ප්‍රදේශවල ගෙවතු වගාව වසාප්ත වී තිබේ.
- සිනියම් ප්‍රදේශයේ නඳු තෘතුම් පාශ්‍රිතව තැනින් තැන වසාප්ත වූ හේන් වගා තිම් ගණනාවක් දැකගත හැකි අතර නිරීතදිග කාර්තුව තුළ හේන් වගාවේ වසාප්තිය සාපේක්ෂව ඉහළ යි.
- සිනියම් ප්‍රදේශය පුරාම නඳු තෘතුම් පාශ්‍රිතව වසාප්ත වූ වෙනත් තැවිලි හඳුනා ගත හැකිය.
- මඩ තෘතුම් පාශ්‍රිතව වසාප්ත වූ කුඩා පොල් වගා තිම් කිහිපී දෙකක් ද හඳුනා ගත හැකිය.

* භූ විෂමතාවයේ ස්වභාවය හඳුනා ගැනීම = ලකුණු 01
* කෘෂිකාර්මික භූමි පරිභෝග හඳුනා ගැනීම = ලකුණු 01
* කෘෂිකාර්මික භූමි පරිභෝග වසාප්තිය හා භූ විෂමතාව අතර සම්බන්ධය නිර්ණය කිරීම = ලකුණු 04

එකතුව = ලකුණු 06

2. • කොරල් මුහුදු - නිල් වර්ණය
   • හෝන් තුඩුව - දුඹුරු වර්ණය
   • ප්‍රෙයරීස් තණ භූමිය - කොළ වර්ණය
   • ඇනටෝලියා සානුව - දුඹුරු වර්ණය
   • මොසැම්බික් බිඩය - නිල් වර්ණය
   • ගෝබි කාන්තාරය - කහ වර්ණය
   • යුකටාන් අර්ධද්වීපය - දුඹුරු වර්ණය
   • බීල්ලූ ඉණානා - නිල් වර්ණය
   • ලෝකයේ ගැඹුරුම සාගරික අාගාධය - මරියානා අාගාධය (නිල්)
   • ලෝක සංචාරක සංවිධානයේ මූලස්ථානය පිහිටි නගරය - මැඩ්රිඩ් (රතු තිතක්)

(ලකුණු 01 x 10 = 10)


N
ප්‍රෙයරීස් තෘණ භූමිය
නීල් ගඟ නිම්නය
මැඩිරිස්
ඩැනවෝල්ගය කාන්තාව
ගෝබී කාන්තාරය
යුකැටන් අර්ධද්වීපය
මරියානා අගාධය
මොසැම්බික් නීඩය
කොරල් මුහුදු
හෝර්න් තුඩුව
*** නම් කිරීමේදී රංචුල භාවිතා කර ඇත්නම් ලකුණු නොලැබේ.

III කොටස

3. (i) දුරස්ථ සංවේදී ක්‍රියාවලිය සඳහා ඌණාශ උපකරණ රැගෙන යන වාහන දුරස්ථ සංවේදී වේදිකාවන් ලෙස හැඳින්වේ.
(ලකුණු 01)

(ii) (a) වාසර වේදිකා

• ගුවනේ සිට භූමිය පිළිබඳ කරන නිරීක්ෂණ වල දී ගුවන් ඡායාරූප ලබා ගැනීම සඳහා කැමරා පද්ධති සහ වෙනත් ඇතුල් උපකරණ තැබීමත් කොට ගුවන් ගත කිරීම සඳහා යොදා ගනු ලබන යානා වාසර වේදිකා ලෙස හැඳින් වේ.

• ගුවන් යානා, හෙලිකොප්ටර, විනිසුන් රහිත ගුවන් යානා, ඌහස් නැව්, කෘත්‍රිම හා චන්ද්‍ර යානා වැනි දෑ වාසර වේදිකා ගණයට අයත් වේ.

(b) ඌභාවකාශ වේදිකා

• ඌභාවකාශ වේදිකා ලෙස රොකට්, බන්ධිකා සහ ඌප්ටාකාශ යානා බහුල ප්‍රයෝජනයන් සාධිනා නෙරේ

• මේවා 250km - 36000km අතර ඉතා ඉහළ ගුවනේ ගියාසර කරයි.

• ගමන් කළ හැකි උන්නතාංශය අනුව මෙම යානා පහත සඳහන් පරිදි වර්ග කොට දැක්විය හැකිය.

- ඌප්ටාකාශ යානා → 250km - 300km
- ඌප්ටාකාශ මධ්‍යස්ථාන → 300km - 400km
- පහළ මට්ටමේ බන්ධිකා → 700km - 1500km
- ඉහළ මට්ටමේ බන්ධිකා → 36000km

(ලකුණු 02 + 02 = 04)

(iii)	ගුවන් ඡායාරූප	බන්ධිකා ප්‍රතිරූප
	පහළ උන්නතාංශයක සිට ලබා ගනියි.	ඉහළ උන්නතාංශයක සිට ලබා ගනියි.
	සාපේක්ෂව අඩු භූමි ප්‍රමාණයක් ඡායාරූපය මගින් ආවරණය කරයි.	සාපේක්ෂව වැඩි භූමි ප්‍රමාණයක් ඡායාරූපය මගින් ආවරණය කරයි.
	භූමිය මතුපිට පවතින රූපමිති පිළිබඳ පමණක් තොරතුරු ලබා ගත හැකිය.	භූමිය මත, පරිච්ඡි ඌභාවකාශය හා වායුගෝලය පිළිබඳවත් තොරතුරු ලබා ගත හැකිය.

ඛනම ප්‍රදේශය නැවත නැවත ආවරණය කරමින් ඡායාරූප ලබා ගත නොහැක.	ඛනම ප්‍රදේශය නැවත නැවත ආවරණය කරමින් ඡායාරූප ලබා ගත හැකිය.
සාපේක්ෂව අඩු විරිවැයක් දැරීමට සිදුවේ.	සාපේක්ෂව ඉහළ විරිවැයක් දැරීමට සිදුවේ.

(ලකුණු 02 × 02 = 04)

(iv) • කාලගුණ හා දේශගුණ විද්‍යාව ආශ්‍රිත කිළේත්තු.

- සාගර විද්‍යාව
- ගිලැසියර් විද්‍යාව
- භූ විද්‍යාව
- කෘෂි කර්මාන්තය
- වන විද්‍යාව
- ජල විද්‍යාව
- ගම්දා මෙහෙයුම් නටයුතු
- ඌපදා සැලසුම්කරණය
- භූගෝල විද්‍යාව

(ලකුණු 02 × 03 = 06)

4. (i) $\bar{x} = \frac{\Sigma x}{n}$

$= \frac{440}{10}$

$= \frac{44}{}$ (ලකුණු 01)

(ii)

වර්ෂය	x	$\bar{x}$	$(x-\bar{x})$	$(x-\bar{x})^2$
2014	73	44	29	841
2015	6	44	-38	1444
2016	4	44	-40	1600
2017	106	44	62	3844
2018	21	44	-23	529
2019	4	44	-40	1600
2020	23	44	-21	441
2021	143	44	99	9801
2022	14	44	-30	900
2023	46	41	2	4
			$\Sigma(x-\bar{x}) =$	$\Sigma(x-\bar{x})^2 =$
			384	21004

(ලකුණු 01 + 02 = 03 යි)

$\Sigma(x-\bar{x})$ $\Sigma(x-\bar{x})^2$

(iii) (a) $MD = \frac{\Sigma(x - \bar{x})}{n}$

$MD = \frac{384}{10}$

$MD = \underline{38.4}$ (ලකුණු 01)


(b) $\sigma = \sqrt{\frac{\Sigma(x - \bar{x})^2}{n}}$

$\sigma = \sqrt{\frac{21004}{10}}$

$\sigma = \sqrt{2100.4}$

$\sigma = \underline{45.8}$ (ලකුණු 02)

(iv) 2014 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ ජනවාරි මාස මුල් වර්ෂාපතනය



මූලාශ්‍රය : ශ්‍රී ලංකා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

• මාතෘකාව = ලකුණු 0.5

• මූලාශ්‍රය = ලකුණු 0.5

• X අක්ෂය = ලකුණු 1.0

• Y අක්ෂය = ලකුණු 1.0

• තීරු නිර්මාණය = ලකුණු 2.0

ඛණ්ඩාව = ලකුණු 5.0

(v) • ජනවාරි මස වැඩිම වර්ෂාපතනයක් ලැබී තිබෙන්නේ 2021 වර්ෂයේදීය.

• ජනවාරි මස අඩුම වර්ෂාපතනයක් ලැබී තිබෙන්නේ 2016 හා 2019 යන වර්ෂ දෙකේදීය.

• 2014, 2017, 2021 සහ 2023 යන වර්ෂ වලදී මධ්‍යනය වර්ෂාපතනයට වඩා වැඩි වර්ෂාපතනයක් ලැබී තිබේ.

• 2015, 2016, 2018, 2019, 2020 සහ 2022 යන වර්ෂ වලදී මධ්‍යනය වර්ෂාපතනයට වඩා අඩු වර්ෂාපතනයක් ලැබී තිබේ.

• කලුගඩිතොට ජනවාරි මස වර්ෂාපතනයේ උච්චාවචනය වනු ස්වභාවයක් දක්නට ලැබේ.

(ලකුණු 01 × 03 = 03)

5. (i) සංගහනය යනු තොරතුරු රැස් කිරීමට අදාළ වූ විෂය ඒකකයයි. එනම් අපේක්ෂිත අධ්‍යයනයට අයත් සමස්තය යි. නියැදිය යනු සමස්ත සංගහනයම නියෝජනය වන පරිදි තෝරාගනු ලබන කොටසයි. (ලකුණු 02)

(ii) (a) ප්‍රාථමික දත්ත හා ද්විතියික දත්ත

කිසියම් අරමුණක් සඳහා යම් ආයතනයක් හෝ පුද්ගලයෙකු මුලින්ම අවශ්‍යතාවයට ගොස් රැස් කර ගන්නා දත්ත ප්‍රාථමික දත්ත ලෙස හඳුන්වනු ලබයි.

තවත් කෙනෙකු හෝ ආයතනයක් හෝ රැස් කර ඇති දත්ත දෙවනුව උපයෝගි කර ගන්නා විට ඒවා ද්විතියික දත්ත ලෙස හඳුන්වයි.

(b) ගුණාත්මක දත්ත හා ගුණාත්මක දත්ත

සංඛ්‍යාත්මකව නිරූපණය කළ හැකි දත්ත ප්‍රමාණාත්මක දත්ත ලෙස හඳුන්වයි. ගුණාත්මක දත්ත යනු සංඛ්‍යාත්මකව ඉදිරිපත් නොකරන දත්තයි.

(c) සන්තතික දත්ත හා විච්ඡින්න දත්ත

දත්තයකින් කියවෙන විවිධාකාර අඛණ්ඩව විහිදිය හැකි නම් එවා සංතතික දත්ත වේ. මේ අනුව සංතතික දත්ත භාග හා දශම සංඛ්‍යා ලෙස ලිය හැකිය.

අඛණ්ඩ විහිදීමක් නැති සංඛ්‍යා දත්ත විච්ඡින්න දත්ත වේ.

(ලකුණු 01 x 03 = 03)

(iii) • සංඛ්‍යා නිරීක්ෂණය

• සහභාගීත්ව නිරීක්ෂණය

(යුදුසු නිදසුන් ඉදිරිපත් කරමින් මෙම කුම දෙක පැහැදිලි කර තිබිය යුතුය)

(ලකුණු 02 x 02 = 04)

(iv) (a) • පුද්ගලික මූලාශ්‍ර

(පුවත්පත්, සඟරා, පොත්පත්, ආර්තා)

• අන්තර්ජාලය

• සිනියම්

• ගුවන් ඡායාරූප

• චන්ද්‍රිකා පුතිබිම්බ

• තීන්තූර

• ඡායාරූප (ලකුණු 0.5 x 04 = 02)

(b) • යාවත්කාලීන වූ තොරතුරු ලබා ගැනීමට අපහසු වීම.

• දත්ත අවශ්‍ය පරිදි ලබා ගැනීමට හැකියාවක් නොමැති වීම.

• දත්ත ලබා ගැනීම සඳහා ඇතැම් විට මුදල් ගෙවීමට සිදුවීම.

• සමහර දත්ත වල විශ්වසනීයත්වයක් නොමැති වීම.


• නවීන තාක්ෂණික ශිල්ප කුම භාවිතයට පුමාණවත් පුහුණුවක් තිබිය යුතු වීම.

• රූහැඳ නිරූපණයක් සහිත චන්ද්‍රිකා ඡායාරූප ලිල අධික වීම.

(ලකුණු 02 x 02 = 04)

6. (i)

ශ්‍රී ලංකාවේ වයස් කාණ්ඩ හා ප්‍රතිශතය දැනුවත් දැක්තමේන්තු කරන ලද මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාව 2024 (දහස් ගණනින්)



මූලාශ්‍රය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව, 2025

- මාතෘකාව = ලකුණු 0.5
- මූලාශ්‍රය = ලකුණු 0.5
- X අක්ෂය = ලකුණු 1.0
- Y අක්ෂය = ලකුණු 1.0
- තීරු නිර්මාණය = ලකුණු 3.0
- වර්ණ ගැන්වීම හා නිමාව = ලකුණු 2.0

ඒකතුව = ලකුණු 8.0

(ii) • රටක ජන සංඛ්‍යාවේ ව්‍යුහය පිළිබඳව මනා චිත්‍රයක් ගොඩ නගා ගත හැකි වීම.

• ජන සංඛ්‍යාවක ප්‍රසාරණය, ස්ථාවරත්වය හෙවි හායනය අවබෝධ කර ගත හැකි වීම.

• ශ්‍රම හමුදාවට සාපේක්ෂව සිටින යැපෙන්නන් ප්‍රමාණය

අනාවරණය කරගත හැකි වීම.

• රටක අනාගත සංවර්ධනයට බලපාන ගැටලු අවබෝධ කරගෙන අනාගත දීර්ඝ - සමාජීය සැලසුම් සකස් කර ගැනීමට පාදක කරගත හැකිය.

(ලකුණු 02 x 02 = 04)

(iii) • චතාන්ම සුදුසු විභය නිර්දේශිත ප්‍රශ්නාරය -
ද්විත්ව තීරු ප්‍රශ්නාරය

• යෝගඵලාව - තිරස් අක්ෂයේ වයස් කාණ්ඩ හා සිරස් අක්ෂයේ ඵල සංඛ්‍යාව දැක්වෙමින් ස්ත්‍රී - පුරුෂ ඵල සංඛ්‍යා ප්‍රමාණය චිනාවබද්ධ තීරු යුගල මගින් නිරූපනය කළ හැකිය. වයස් කාණ්ඩ හා ස්ත්‍රී - පුරුෂ ඵල සංඛ්‍යාව අතර පවතින වෙනස්කම් සංසන්දනය කළ හැකිය.

(ලකුණු 01 + 02 = 03)

භූගෝල විද්‍යාව II

1. (i) • කඳු ශිලාඝියර් / නිම්න ශිලාඝියර් / දෑල්තයින් ශිලාඝියර්
• මහද්වීපික ශිලාඝියර්

(ලකුණු 01 x 02 = 02)

(ii) A - පිරමීඩාකාර මුදුන
B - ඌර්වය
C - සර්නය / කොරිය
D - ගිරි නිල / ටාන් නිල
E - ලම්බ නිම්නය / එල්ලෙන නිම්නය
F - පීත්තපථ නිල / රිඹන් නිල / නිල් ඈල

(ලකුණු 01 x 06 = 06)

(iii) • මොරේන
• බුල්ලීන
• ඛස්කර්
• කේම
• ඒගණ් ගල්

රූප සටහන් ඇඳීමින් නිර්මාණ ක්‍රියාවලිය පැහැදිලි කර තිබිය යුතුය.

(ලකුණු 02 x 03 = 06)

(iv) • සංචාරක ආකර්ශනයක් ලෙස වැදගත් වීම.
• ධ්‍රැව නිම්න වල ගලා බසින ගංගා නාවික පරිවහනයට යොදා ගැනීම.
• දැහැරා ඇලි නිදුලිබල උත්පාදනයට යොදා ගැනීම.
• කුණා හා නිවෝද කටයුතු සඳහා භාවිතා කිරීම.
• ෆියොඩ වෙරළ ලක්ෂණ වර්ගයන් හා නැව් නිෂ්පාදන තටාකාංගන රූපි කිරීමට යොදා ගැනීම.
• ඌකුරු මැටි ආශ්‍රිතව යපස් නිධි පිහිටා තිබීම.
• ග්ලැසියර් ඛාදනයෙන් නිර්මාණය වූ තැනිතලා බිම් වල කෘෂිකාර්මික කටයුතු සිදු කිරීම.
(ලකුණු 02 × 03 = 06)

2. (i) • උෂ්ණත්වය
• වර්ෂාපතනය
• ආර්ද්‍රතාව
• වායු පීඩනය
• සුළං වේගය
• සුළං දිශාව
• වාෂ්පීකරණය (ලකුණු 0·5 × 04 = 02)

(ii) (a) පරිසර පතන ශීඝ්‍රතාව
පරිවර්තී ගෝලය තුළ උන්නතාංශය වැඩි වීමත් සමඟ උෂ්ණත්වය පහළ බැසීමේ ක්‍රියාවලිය පරිසර පතන ශීඝ්‍රතාව ලෙස හඳුන්වනු ලැබේ. මෙහි අගය මුහුදු මට්ටමේ සිට ඕහැ නගින සෑම මීටර් 1000 ටම 6.4°C කි වේ. නමුත් දැනටමී පාරිසරික සාධක නිසා මෙම අගය වෙනස් විය හැක.

(b) නියැදි පතන ශීඝ්‍රතාව
ජල වාෂ්ප සහිත වායු පාර්සලයක් පරිවර්තී ගෝලය තුළ ඕහැට ගමන් කරන විට එම වායු පාර්සලයේ සංතෘප්ත අවස්ථාව දක්වා උෂ්ණත්වය අඩු වන්නේ නියැදි පතන ශීඝ්‍රතාවට අනුවය. එහි අගය 1000 m ට 10°C කි වේ. මෙය නියත අගයකි.

(c) තෙත් පතන ශීඝ්‍රතාව
ජල වාෂ්ප සහිත වායු පාර්සලයක් සංතෘප්ත වූ පසුව තව දුරටත් ඕහැට ගමන් කරන විට එහි උෂ්ණත්වය

ඇඹුවන්නේ තෙත් පතන ශීඝ්‍රතාවට ඇනුවය. බිම් ඇගය 1000m ට රිටන් වේ. මෙය ඈ නියත වර්ණාකමකි. වාෂ්ප පාර්සලය සංතෘප්ත වන විට බිම් අඩංගු ගෘහ්ත තාපය අවකාශයට නිදහස් කරනු ලබයි.

(ලකුණු 02 x 03 = 06)

(iii) • සූර්ය විකිරණ තීව්‍රතාවය.

• ඌර්ධ්වාංශ ඇනුව සූර්ය විකිරණයේ ඇති වන වෙනස.

• සාගර හා ගොඩබිම් වාෂ්පීය.

• සාගර ප්‍රවාහ (දියවැල්).

• කඳුබෑවුම/ උන්නතාංශය.

• අඩු පීඩන හා වැඩි පීඩන පද්ධතිවල පිහිටීම.

(ලකුණු 02 x 03 = 06)

(iv) • Af - නිවර්තන වර්ෂා වනාන්තර වර්ගය.

• Am - නිවර්තන මෝසම් සුදු වර්ගය.

• Aw - නිවර්තන තෙත් හා වියළි (සැවානා) වර්ගය.

(ලකුණු 02 x 03 = 06)

3. (i) බියෝමයක් යනු යම් දේශගුණ වර්ගයකට අනුවර්තනය වූ නිශ්චිත ශාක හා සත්ත්ව ප්‍රජාවන් සහිත පරිසරයකි.

(ලකුණු 02)

(ii) (a) වයිගා බියෝමය

• ශාක කේතුරුහාකාරය.

• ඉඳිකටු වැනි පතු සහිතය.

• ශාක විශේෂ ගණන ඉතා අඩුය.

• ශාකවල උපරිම උස 12m - 20m පමණ වේ.

• යටි රෝපණය දුර්වලය.

• අඩු රෙජව විච්ඡේදනයක් ඇත.

(b) තාන්තාර බියෝමය

• ශාක වැස්ම පැතිරී නැත.

• ශූන්‍යතාවයට ශාක අනුවර්තනය වී ඇත.

- සිහින් පතු දැරීම.
- කටු සහ යුෂ සහිත බව.
- පතු පතනය.
- මාංශල කඳන් දැරීම.
- පතු ඝටි වැස්ම සහිත වීම.
- දිගු මුල් පද්ධතිය.

(උ) තුන්දා නියෝමය

• නෙවි ගිම්හානයේ පමණක් පැළෑටි වර්ධනය වේ.

• ඵුනා දඹු වෙත්ව විවිධත්වයක් පවතියි.

• ගිලෙන් වැසුණු භූදේශයේ තෙත බාසි වැටේ.

• තුන්දා ශාක භූමාවේ ප්‍රමුඛස්ථානය තෘණ ය.

• කාෂ්ඨීක ශාක නොමැත.

• ශාක පතු සිහින්ය/ කේශර දැත / පතු දැතුළට නැමී පිහිටයි

(ලකුණු 02 x 03 = 06)

(iii) • මධ්‍යම පරිසර අධිකාරිය

• ජාතික ගල්ගස් සම්පත් පර්යේෂණ නියෝජන ආයතනය.

• වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව.

• ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය.

• භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය.

(ලකුණු 02 x 03 = 06)

(iv) • නෛතික පද්ධතියේ දැති දුර්වලතා.

• දේශපාලන මැදිහත් වීම.

• නීති හා අණපනත් පිළිබඳව ජනතාවගේ නොදැනුවත් භාවය.

• ඓතිහාසික හූමිති සහ උපමාන ක්‍රියාවට නැංවීමට ප්‍රමාණවත් තරම් තාක්ෂණික මෙවලම් නොමැති වීම.

• රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය දුර්වල වීම.

(ලකුණු 02 x 03 = 06)

4. (i) • පෙර සූදානම

• පූර්වාරම්භ දැන්වීම.

• යථා තත්ත්වයට පත් කිරීම.

• අවම කිරීම. (ලකුණු 0·5 x 04 = 02)

(ii) ඉහත ඛේනැම අවස්ථා තුනකට අදාළව ගත හැකි ක්‍රියා මාර්ග විස්තර කර තිබිය යුතුය. (13 ශ්‍රේණිය - ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය - 59/60 පිටු)

(ලකුණු 02 x 03 = 06)

(iii) • අනුමත් ඉඩම් පරිහරණය.

• අවිධිමත් ඒදි කිරීම්.

• කාර්මික ක්‍රියාකාරකම්.

• වනාගරණය. (ලකුණු 02 x 03 = 06)

(iv) • ආපදා හා ඒනාට ප්‍රතිචාර දැන්වන ආකාරය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම.

• ආපදා කළමනාකරණය සඳහා පුජා සහභාගිත්වය ලබා ගැනීම.

• ආපදා කළමනාකරණ ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම.

• පෙර පූහුණු වැඩසටහන් පැවැත්වීම.

• පූර්ව අනතුරු ඇඟයීම් නිවැරදි කිරීම.

(ලකුණු 02 x 03 = 06)

5. (i) ජන සංඛ්‍යාවක ස්ත්‍රීන් 100 දෙනෙකුට සිටින පුරුෂයන් සංඛ්‍යාව පුරුෂ අනුපාතය ලෙස හඳුන්වයි.

(ලකුණු 02)

(ii) • සමස්තයක් ලෙස ගත් විට පුරුෂ අනුපාතය දිගු දැගයක් ගෙන තිබේ. එය 2012 වර්ෂයේදී 93.8ක් වන අතර 2024 වර්ෂයේදී 93.3ක් වේ. මේ අනුව ශ්‍රී ලංකාවේ පුරුෂයින්ට සාපේක්ෂව ස්ත්‍රීන් සංඛ්‍යාව වැඩිය.

• 2012 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී පුරුෂ අනුපාතය තව දුරටත් පහළ බැසීම.

• වයස අවුරුදු 0-19 හෙවත් ළමා සහ ශ්‍රම බලකායේ මුල්ම වයස් කාණ්ඩ වල පුරුෂ අනුපාතය 100ට වඩා ඉහළ දැගයක් ගැනීම. එබැවින් එම වයස් කාණ්ඩ වල ස්ත්‍රීන්ට සාපේක්ෂව පුරුෂයින් පුමාණය ඉහළ ය.

• ඉහළම පුරුෂ අනුපාතයක් වාර්තා වන්නේ අවුරුදු 10-14 කාණ්ඩයෙනි.

• වයස් ගත වීමත් සමඟ පුරුෂ අනුපාතය ශීඝ්‍ර ලෙස පහළ බැසී.

• අඩුම පුරුෂ අනුපාතයක් (69.8) වාර්තා වන්නේ අවුරුදු 70ට වඩා වැඩි කාණ්ඩයෙනි.

• වයස් කාණ්ඩ අනුව පුරුෂ අනුපාතයේ දැඩි විචලනයක් නිරීක්ෂණය නොවීම හැකි වේ.

(ලකුණු 02 x 03 = 06)

(iii) • රටක ශ්‍රම බලකාය තුළ පුරුෂයන්ගේ ආධිපත්‍යය අඩු වීම නිසා ශ්‍රම ඵලදායිතාව අඩු වීම.

• ආනයනික කාන්තාවන් පුමාණය වැඩි වීම.

• දැනිවාහක කාන්තාවන් වැඩි වීම නිසා ජන සංඛ්‍යා වර්ධනය පහළ බැසීම.
• විවාහ ශීඝ්‍රතාව දුඩු වීම.
• කාන්තාවන් වැඩි වීම නිසා සමාජ දූපහාර, ඝියගැන්වීම්, හොරකම් වැනි නීති විරෝධී ක්‍රියාවන් වැඩි වීම.
• ජන සංඛ්‍යාව වයස්ගත වීමේ ගැටලුවට වැඩිපුර ලුහුණු දීම.
(ලකුණු 02 x 03 = 06)

(iv) • කාන්තා අධ්‍යාපනය ඊහැදි නැංවීම.
• සමාජ දූරදක්ෂතා සුළු දැක්ම කිරීම මගින් කාන්තාවන් සතිගල ගැන්වීම.
• පුරුෂයින් පමණක් සිදු කරන ගොහෝ වෘත්තීන් සඳහා කාන්තාවන් පුහුණු කරවීම.
• සමාජ දූර්ණික ප්‍රතිපත්ති කාන්තාවන්ට හිතකර වන පරිදි සකස් කිරීම.
(ලකුණු 02 x 03 = 06)

6. (i) • මිනිසා • ජාල (දැලිස්)
• සමාජය • ව්‍යාපාරික පරිසරය
• ආකර්ෂණ (ලකුණු 0.5 x 04 = 02)

(ii) (a) A - විකීර්ණ ජනාවාස රටාව
B - ආකීර්ණ / පොකුරු ජනාවාස රටාව
(ලකුණු 01 x 02 = 02)

(b) A - විකීර්ණ ජනාවාස රටාව
• ගොඩනැගිලි හා වාසස්ථාන විසිරුණු හුදෙකලා ස්වභාවයකින් යුක්තය.
• භෞතික සාධකවල බලපෑම, ඉඩම් සුලභ වීම, සත්ව පාලනය හා වතු වගාව ආදිය හේතුවෙන් විකීර්ණ ජනාවාස ගොඩනැගී තිබේ.
• කඳුකර ප්‍රදේශවල ගොඩතොළ ජනාවාස දුරින් දිහිටා තිබීම නිසා විකීර්ණ රටාවක් ගෙන තිබේ.

B - ආකීර්ණ / පොකුරු ජනාවාස රටාව
• විස්තෘත පතුල් සබඳතා, සම්පත් බහුල ප්‍රදේශවලට ඇඳීම, ආරක්ෂාව ආදී හේතූන් මත ආකීර්ණ ජනාවාස ගොඩනැගේ.

• මෙම ජනාවාස රටාවේ නිහැඩ හා සන්ධි ලෙස ස්වරූප දෙකක් හඳුනා ගත හැකිය.

• සන්ධි ජනාවාස දැනාභිගත, රේඛීය හා සැලසුම්ගත ලෙස තැවත වර්ග කරයි. මෙතැනි ජනාවාස රටා නිහිවීමට දායිධ හේතු සාධක බලපා තිබේ.

(ලකුණු 02 x 02 = 04)

(iii) (a) වියැලි කලාපීය තැන් ගම්මාන.

• තැනක් කේන්ද්‍ර කරගෙන නිර්මාණය වී තිබේ.

• ගම්මානය හැඳින්වීමට පොහෝ විට වැවේ නම භාවිතා කරයි.

• මෙම ගම්මානවල ප්‍රධාන සංරචක පහක් හඳුනා ගත හැකිය. (වැව / කුඹුරු / ගංගොඩ / ගෙවතු / කැලෑව)

• ගම්මානයේ වැඩි දෙනෙක් ප්‍රාථමික ආර්ථික කටයුතු වල නිරත වේ.

• කුලය මත පදනම් වූ සමාජ ව්‍යුහයක් දැකගත හැකිය.

(b) වතු ජනාවාස.

• යටත් විජිත පාලන සමයේ ආරම්භ වී තිබේ.

• දකුණු ඉන්දීය සම්භවයක් සහිත පුද්ගලයින් ජීවත් වේ.

• නුවරඑළිය, බදුල්ල, මහනුවර, ලාතලේ වැනි දිස්ත්‍රික්ක වල බහුල ය.

• රේඛීය ජනාවාස රටාවක් දැකිය හැකිය.

• යටිතල පහසුකම් ඉතා අවම ය.

• වැඩි හිරිස ප්‍රාථමික ආර්ථික කටයුතු වල නිරත වේ.

• වතු පාලන නිවාස, කර්මාන්ත ශාලාව, වතු පාසල, බිස්පෙන්සරිය, වෙළඳසැල හා තෝවිල යන අංග දැක්නට ලැබේ.

(ලකුණු 03 + 03 = 06)

(iv) • නාගරික හා ගැම් නාගරික ජනාවාස වල ඉඩම් මිල ඉහළ යෑම.

• නාගරික හා ගැම් නාගරික ජනාවාස වල නිවාස සිරස් අතට වර්ධනය වීම.

• ග්‍රාමීය ජනාවාස අඩු වී නාගරික හා ගැම් නාගරික ජනාවාස වැඩි වීම.

• සැලසුම්ගත ග්‍රාමීය ජනාවාස ඉදිවීම.
• විශාල වතුබල ලයිම් නාමර වෙනුවට තනි ගෙවල් ඉදිකිරීම
• වැඩි පහසුකම් සහිත නිවාස සංකීර්ණ ඉදි කිරීම.
• නාගරික ජනාවාසවල බල ප්‍රදේශ පුළුල් කිරීම.
(ලකුණු 02 x 03 = 06)

7. (i) • මතුපිට කැණීම } නෙවියෙන් හැඳින්විය
• භූගත කැණීම } යුතුය. (ලකුණු 01 x 02 = 02)

(ii) • ලෝකයේ සෑම ප්‍රදේශයකම පෙට්‍රෝලියම් වසාප්ත වී නැත.
• පෙට්‍රෝලියම් සංචිත වලින් බොහොම වැඩා වසාප්ත වී ඇත්තේ ලැදිපෙරදිග කලාපයට බොහෝ රටවල ය.
• තෙල් සංචිත වසාප්ත වැනෙක් රටවල් නැත්තේ නැනඩාව, චෙනිසියුලාව, බ්‍රැ.ඒ.ජ., රුසියාව, ලිබියාව, නයිජීරියාව හා කසනස්ථානය වැනි රටවල් ය.
• ගොඩබිමට බොහෝ දුරින් උතුරු මුහුද, කැරිබියන් මුහුද වැනි සාගරික ප්‍රදේශ කැණීම් මගින් පෙට්‍රෝලියම් සංචිත වසාප්ත වීම.
(ලකුණු 02 x 03 = 06)

(iii) • එක්සත් ජනපදය, චීනය හා කැනඩාව ප්‍රධාන නිෂ්පාදකයන් වුව ද ප්‍රධාන බොහෝ පාරිභෝගිකයන් වීම.
• රුසියාව ප්‍රධාන බොහෝ අපනයනකරුවා වීම.
• ප්‍රධාන නිෂ්පාදකයින් වන බ්‍රැ.ඒ.ජ. හා චීනය ප්‍රධාන ආනයනකරුවන් ද වීම.
• ලෝකයේ පෙට්‍රෝලියම් නිෂ්පාදනය හා වෙළඳාම පාලනය කරනු ලබන්නේ ප්‍රධාන සමාගම් කීපයකිනි.
• පෙට්‍රෝලියම් වෙළඳාම පිළිබඳ ඒකාධිකාරයක් පවත්වාගෙන යාමට ඔපෙක් සංවිධානය පිහිටුවාගෙන තිබීම.
• පෙට්‍රෝලියම් සඳහා පවතින ඉල්ලුම ශීඝ්‍රයෙන් වැඩෙයාම.
(ලකුණු 02 x 03 = 06)

(iv) • ජල විදුලිය
• සූර්ය ශක්තිය
• සුළං බලය
• උදම්
• රේඩිය ඝනත්වය
} විභවතාව පැහැදිලි කර තිබිය යුතුය.

(ලකුණු 02 x 03 = 06)

8. (i) යටත් පිරිසෙන් චන්ද්‍රාත්‍රියන්ගේ දිවයින්හි ගතකරන ආගන්තුකයෙක් සංචාරකයෙකු ලෙස හඳුන්වනු ලැබේ.
(ලකුණු 02)

(ii)
- කොටුඹ නගරය
- මහ නොදුඹ
- දෙකුන්දු වෙරළ
- නැගෙනහිර වෙරළ
- උස්බිම් ප්‍රදේශය
- පුරාණ නගර
- උතුරු ප්‍රදේශය

ඕනෑම නිලාප තුනක භූගෝලීය ව්‍යාප්තිය හා සංචරණ රූපවිද්‍යාත්මක පැහැදිලි කර තිබිය යුතුය.
(ලකුණු 02 x 03 = 06)

(iii)
- විවිධ ජාතීන් හා සංස්කෘතීන් හඳුනා ගැනීමට හැකිවීම.
- සමාජීය හා සංස්කෘතික අගයන් ප්‍රචලිතවීම.
- ශ්‍රී ලාංකිකයන් විදේශීය භාෂා ඉගෙනීමට පෙළඹීම.
- ලෝක උරුම හා පුරාවස්තු සංරක්ෂණයට ලැබෙන දායකත්වය.
- විදේශීය ආයෝජන් ගන්නා සිරිත් අනුගමනය කිරීමට පෙළඹීම.
- සදාචාර පරිහානිය.
- ළමා අපචාර වැඩිවීම.
- සමාජ රෝග පැතිර යාම.
- මත්ද්‍රව්‍ය භාවිතය වැඩිවීම.
- ආගමික හා සංස්කෘතික වටිනාකම් ඇති හානිවීම පිටරටට ඇදී යාම.
- ඇතැම් සංචාරකයන් දේශීය ආගමික චාම් පිදිවෙන් වලට ගරු නොකිරීම.
(ලකුණු 02 x 03 = 06)

(iv)
- සංචාරක කර්මාන්තය පිළිබඳ ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම.
- සංචාරකයාගේ ආරක්ෂාව තහවුරු වන පරිසරයක් ගොඩ නැගීම.
- දේශීය සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.
- සංචාරක කර්මාන්තය නැති නව ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීම.
- සංචාරක කර්මාන්තයේ අහිතකර ඵලපෑම් අවම කිරීම සඳහා ක්‍රියා මාර්ග ගැනීම.
(ලකුණු 02 x 03 = 06)

* * *

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank
CamScanner